# ප්‍රවෘත්ති නිවේදනය
# PRESS RELEASE

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය

சுகாதார மற்றும் சுதேச வைத்திய சேவைகள் அமைச்சு அத்துடன் பெண்கள் மற்றும் சிறுவர் மற்றும் சமூக பாதுகாப்பு

Ministry of Women & Child Affairs, Social Security, Health & Indigenous Medicine Services

Telephone office: 2693919 / Gen: 2694033 / 2669192 / 2675011 / 2675449 / Fax: 2689540


**2020.03.24**

ප්‍රධාන කර්තෘ පුවත්පත්,
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ - රූපවාහිනී /ගුවන්විදුලි
සංස්කාරක වෙබ් පුවත්

## ඇඳිරි නීතිය පවතින කාලය තුල ෆාමසි විවෘත කර තැබීමට පියවර ගැනේ.

රට තුල කොරෝනා වෛරසය පැතිරයාම මැඩපැවැත්වීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කර තිබෙන වැඩපිළිවෙලට අනුව ඇඳිරිනීතිය පැනවීම හේතුවෙන් දෛනිකව රෝහල් සායනවලින් සහ ෆාමසිවලින් ඖෂධ වර්ග ලබාගන්නා රෝගීන් විශාල සංඛ්‍යාවක් අපහසුතාවයට පත්ව ඇත.

මේ තත්ත්වය සැළකිල්ලට ගනිමින් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් විශේෂ වැඩපිළිවෙළක් සකසා ඇත.

ඒ අනුව සියළුම ඖෂධ සැල් අවශ්‍යතාවය පරිදි ඇදිරිනීතිය පවතින කාලය තුල විවෘත කර තැබීමට අවස්ථාව සළසා දෙන ලෙස සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් පොලිස්පතිවරයාට උපදෙස් ලබා දී ඇත. මෙහිදී රෝගියාගේ රෝග විනිශ්චය හා ඖෂධ වට්ටෝරුව ඇදිරිනීති අවසර පතක් ලෙස සළකන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය පොලිස්පතිවරයාට දන්වා ඇත.

එමෙන්ම ඖෂධ සැල්වල සේවය කරන සේවකයින්ට සහ ඖෂධ ප්‍රවාහනය කරන වාහන සඳහා අවසරය ලබාදෙන ලෙසට සෞඛ්‍ය අමාත්‍යාංශය පොලිස්පතිවරයාගෙන් ඉල්ලීමක් කර ඇත.

විරාජ් අබේසිංහ
(මාධ්‍ය ලේකම්)
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය